35 වන පිටෙන්




වාකරෙ ප්‍රදේශයේ ප්‍රචාරක කටයුතුවල යෙදුණු අප එයට පසුව කරදියනාරු බලා පිටත්ව යාමට සූදානම් වුණු මොහොතේ එම ප්‍රදේශ පිළිබඳව හොඳින් දැන සිටි සටන්කාමීයෝ සිව් දෙනෙකු අපට ඉදිරියෙන් යතුරු පැදි දෙකක ගමන් කළහ. ඔවුන් පිටව ගොස් ස්වල්ප මොහොතකින් කිසිවෙකුවත් නොසිතූ අයුරින් සිදුකළ ක්ලේමෝ බෝම්බ ප්‍රහාරයකින් වගකීම් භාර තනතුරක් දැරූ සටන්කාමීයෙකු මිය ගිය අතර, සටන්කාමී සහෝදරියක් බරපතල තුවාල ලැබුවාය. පණ බේරාගත් සටන්කාමීන් දෙදෙනෙකු කැළෑ මැද්දෙන් පලාගොස් අවසානයේ අප ළඟට පැමිණියහ. එවැනි තත්ත්වයක් තුළ වන්නියේ සිට ගොස් එහි කටයුතු කිරීම යනු අධික ලෙස ජීවිත අනතුරුදායක තත්ත්වයකට පත් කරන අභියෝගාත්මක දෙයක් විය. වන්නි සටන් පෙරමුණුවල කොටි සංවිධානය ලැබූ විශාල ජයග්‍රහණයන්ට පිටුපසින් තිබූ නැගෙනහිර පළාතේ සටන්කාමීන්ගේ වීරත්වය, නිර්භීත බව සහ කැපවීම අති විශාලය යන්න අමතක කළ නොහැකිය. මම නැගෙනහිර පළාතේ ජනයා හමුවූ අවස්ථාවල ඔවුන් පිරිනැමූ ස්නේහෙවන්ත හැඟීම් ද සුළුපටු නොවේ.

නැගෙනහිර පළාතේ සටන්කාමීන් සමඟ කළ සහෝදර ඝාතක යුද්ධය මහත් වේදනාවක් එම ජනයාට හිමිකර දී තිබූ බව කෙළින්ම ඔවුන්ගෙන් අසා දැනගත් මොහොතේ ඇතිවූ මානසික වේදනාව සිතා ගැනීමට නොහැකි තරමට ඛේදජනකය. වසර ගණනාවක් තිස්සේ අප සමඟ එක්ව සටන් කළ අයගේ ජීවිත අපි විසින්ම උදුරාගත් විටද වගකීම් භාර අයගේ දුර්වලතාවය හේතුවෙන් වංචාකාරී උගුලකට හසුවීමෙන්ද, පිටුපසින් සිට පිහියෙන් ඇන්න ද්‍රෝහී බව නිසා සමාව දිය නොහැකි යැයි දිව්රා පැවසුවත්, මතුවූ අවස්ථාවට මුහුණ දී පිලි පැන්න සාමාන්‍ය පසුපෙළේ සටන්කාමීන්ටවත් සමාව නොදී මානව හිතවාදයට ඔබ්බෙන් ක්‍රියාත්මක වී එම සටන්කාමීන් කිසිම අනුකම්පාවකින් තොරව සංවිධානය විසින් මරා දමන ලද අවස්ථාවේත් අපි නැවතත් අදිසි කුමන්ත්‍රණ උගුලකට හසුවූයෙමු. මෙම කුරිරු පලිගැනීමේදී ජීවිත අහිමි වූ තම දරුවන්ගේ මළ සිරුරු පවා තමන්ට ලබා දුන්නේ නැත යනුවෙන් අඬා වැළපුණ මව්පියන්ව සැනසීමට ලක් කළ යුතු තත්ත්වයකට මම පත්වූයෙමි.

'අපේ දරුවෝ රට වෙනුවෙන් කියලනේ සටන් කරන්ඩ ගියේ. සංවිධානේ විශ්වාස කරගෙන ගිය ළමයින්ව සංවිධානයෙන් මරලා දැම්මනේ' යැයි ඔවුහු හඬා වැළපුණහ. මේ පිළිබඳව සංවිධානය අප වෙත ලබා දී තිබූ දේශපාලන පැහැදිලි කිරීම් මෙම දෙමව්පියන්ට අවබෝධ කරදිය හැක්කේ කෙසේද? එම අවස්ථාව අතිශයින්ම හැඟුම්බර වීය. හිතට මහත් බරකි. මෙවැනි අවස්ථා පසුකරමින් තමයි විමුක්ති ව්‍යාපාරයට ඉදිරියට යාමට සිදුව ඇත්තේ යන්න තේරුම් ගැනීම මට පමණක් නොව බොහෝ සටන්කාමීන්ට ගිණි අඟුරු ගිලින්නාක් මෙන් වීය.

වෙරුගල්ආරු ගං ඉවුරේ සටන්කාමී සහෝදරියෝ නතරව උන්හ. වන්නියේ සිට මාලතී බළසේනාවේ සටන්කාමී සාමාජිකාවන්ද ප්‍රහාරය සඳහා යැවීය. ආයුධ අතට ගත් කාන්තාවන්ගේ ජීවිතයේ මෙය ඉතාමත් හානිකර කළු පැල්ලමක් සහිත දින ගණනක් වීය. නැගෙනහිර පළාතේ සටන්කාමී සහෝදරියන් ආරක්ෂාව පතා හිස හැරුණු අත දුවගෙන ගිය බවත්, ඔවුන්ගේ තුවාලවලට ශ්‍රී ලංකා හමුදාවේ අය ප්‍රථමාධාර ලබාදී ගෙවල්වලට යැවූ බවත් එම සිද්ධිය ඇසින් දුටු ජනතාව මා සමඟ පැවසූ අවස්ථාවේ මම කිසිවක් කරකියාගත නොහැකිව ගොළුවී උන්නෙමි. 2009 වසරේදී මුල්ලිවයික්කාල්වලදී එම තත්ත්වයන්ටම අපට මුහුණ දීමට සිදුවූ මොහොතේ මට එම වේදනාවේ කුරිරු බව ගැඹුරින් අවබෝධ කර ගැනීමට හැකිවීය. ජාතියේ විමුක්තිය උදෙසා යන්නට යටවී ගිය සත්‍යයක් වෙනුවෙන් කුමන සීනුව නාද කර යුක්තිය ඉල්ලා සිටිය හැක්කේ කාගෙන්ද?

මතු සම්බන්ධයි

JAPANESE
By a qualified experienced teacher with proven results
PREP to VCE
● Rapid Learning Strategies
● Special Attention for School Assessment Course work (SAC) according to VCAA Study Design.
● Exam Revision and Preparation for VCE written and oral exam.
12+ Years' Experience in Teaching
Postgraduate Diploma of Education (Monash University), B.A. (Hon)
Trained in Japan through a Japanese government scholarship to teach Japanese language.
Contact Number: 0425 396 975




**මහින්ද ගුණවර්ධන**

## ගුරුවරයා

ගෙටන් සෙන් ගුරුතුමා ටොකුගාවා යුගයේ අවසාන කාලයේ ජීවත් වූ කෙනෙක්. ඔහු මේ විදියට අදහස් දැක්වුවා.
"අනුගාමිකයන් තුන් ගොල්ලක් ඉන්නවා. අනෙක් අයට සෙන් කියා දෙන අය එක වර්ගයක්. පන්සල් සහ පිළිම බලා කියා ගන්නා අය දෙවන වර්ගය. සහල් මලූ හා ඇඳුම් එල්ලන අය උපකරණ විදියට



තමයි තුන් වැනි වර්ගයේ ස්වභාවය" ගසන් ද මේ අදහස ප්‍රකාශ කළා. ඔහු ටෙකිෂුයි යටතේ ඉගෙන ගත්තා. ටෙකුෂුයි බෙහෙවින් සැර පරුෂ කෙනෙක්. ඔහු ඇතැම් වෙලාවල ගසන්ට පහර දුන්නා. සෙසු ශිෂ්‍යයො මේ ඉගැන්වීම් ක්‍රමය ගැන කලකිරී ඔහු අතහැර ගියා. ගසන් රැඳී සිටියා.

"දුර්වල ශිෂ්‍යයෙක් ගුරුවරයාගේ බලපෑමට නතු වෙනවා. සරල අනුගාමිකයෙක් ගුරුවරයාගේ කරුණාව අගය කරනවා. හොඳ අනුගාමිකයෙන් ගුරුවරයාගේ විනය යටතේ වඩ වඩා ශක්තිමත් වෙනවා" ගසන් තම අදහස පැහැදිලි කළා.

## දැනුම

කකුවා අධිරාජයා මුණ ගැසුණා. ඊට පස්සේ අතුරුදන් වුණා. ඔහු ගැන ආරංචි නෑ. චීනයේ චාන් ඉගෙන ගන්නට ගිය පළමු ජපන් ජාතිකයා තමයි ඔහු. කකුවා චීනයේ දී සැබෑ "චාන්" ඉගෙන ගත්තා. සංචාරය කළේ නෑ. නො කඩවා ම භාවනා කළා.

ඔහු චීනයේ ජීවත් වූයේ දුරස්ථ ප්‍රදේශයක තිබූ කඳුවැටියක. මිනිසුන්ට ඔහු ගැටුනා ම "ධර්ම දේශනා කරන්න" යැයි ඉල්ලා සිටි අවස්ථාවල දී ඔහු වචන කිහිපයක් ප්‍රකාශ කර කඳු වැටියේ වෙනත් පැත්තකට යාම සිරිතක් කර ගත්තා. එසේ ගියේ ලෙහෙසියෙන් සොයා ගැනීමට බැරි ප්‍රදේශයකට.

කකුවා ජපානයට ආවාට පස්සේ අධිරාජයාට දැනගන්නට ලැබුණා. රජතුමා ඔහුගේ දැනුම ගැන ප්‍රකාශ කරන ලෙසට ඉල්ලා සිටියා.

කකුවා නිශ්ශබ්දව රජු ඉදිරියේ සිටියා. ලෝගුව තුළින් බට නලාවක් ගෙන ලඝු ස්වරයක් වාදනය කළා. හිස නමා ආචාර කර අතුරුදන් වුණා.

කකුවා අවබෝධකරගත් දෑ ඔහු ජපානයට ගෙනාවේ නෑ. ඔහු ගැන සඳහන් වන්නේ තනි ස්වරයක් වාදනය කළ විත්තිය පමණයි.